# ජේ.කේ.ඩබ්ලිව්.වී.ජයවර්ධන එ. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ 2065/2020 (2020.07.22 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - ජේ.කේ.ඩබ්ලිව්.වී.ජයවර්ධන
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**
මෙය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019-09-03 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.10.16 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.10.19 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.12.23 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019-09-03 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

*5/3//ම.ප./නැ /වෙල්ලාවලි/01 දරන ලිපිගොනුවට අදාලව පහත තොරතුරු ඉල්ලා සිටිමි.*

*1) ඉහත කී 5/3//ම.ප./නැ /වෙල්ලාවලි/01 දරන ලිපිගොනුවට සම්බන්ධව මාගේ දැනුම් දීම් අනුව ඉ.කො. ජනරාල් දෙපාර්තමෙන්තුවේ නිලධාරි විසින් වර්ෂ 2015.08.28 සිට 2019.08.30 දින දක්වා නැගෙනහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත යවන ලද ලිපි වල දිනයන් පිළිවලින්*

*2) අම්පාර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් විසින් ඉහත කී 5/3//ම.ප./නැ /වෙල්ලාවලි/01 දරන ලිපිගොනුවට 31/2/LD/29 අංක යටතේ 2018.10.02 දිනැති ඉ.කො. ජනරාල් වෙත එවන ලද ලිපියේ 5 වන ඡේදයට අමුණා ඇති ඇමුණුම් අංක 8,9 සහ 6 ඡේදයට අමුණා ඇති ඇමුණුම් 21,22 යන ඇමුණුම් ඉල්ලා සිටින ලදී.*

*තොරතුරු නිලධාරියා නියමිත කාලය තුළ ප්‍රතිචාර දක්වමින් තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර සිටින ලදී.එම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2019.07.18 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2019.12.23දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.*

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමකට ලක් විය හැකියි.

පොදු අධිකාරීය විසින් කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක වෙත යොමු කර ඇති අංක 5/3/ම.ප/නැ/වෙල්ලා/01/ (රන්බිම) සහ 2020/01/31 දිනැති ලිපියෙහි දෙවන ඡේදය කෙරෙහි අවධානය යොමු කර සිටි.

> " මා විසින් නැගෙනහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලද 2015.08.28 සිට 2019.08.30 දින දක්වා ලිපිවල දිනයන් ඉල්ලා ඇති නමුත් ඔබ වෙත ලබා දිය හැක්කේ එයින් ඔබට පිටපත් සහිතව යොමු කරන ලද ලිපිවල දිනයන් පමණි. ඒ අනුව 2018.12.31, 2019.05.06,2019.05.31 හා 2019.07.31 යන දිනවල ලිපි යොමු කර ඇති අතර ඒවායේ පිටපත් මේ සමග අමුණා ඇත
>
> තවද අම්පාර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් විසින් මා වෙත යොමු කරන ලද අංක 31/2/LD/29 හා 2018.10.02 දිනැති ලිපියේ ඇමුණුම් අංක 3,4,5,6, හා 7 යන ඇමුණුම් මගින් යොමු කර ඇත්තේ වෙනත් පාර්ශවයක් විසින් පරීක්ෂනයක් සඳහා ලබාදී ඇති ප්‍රකාශයන් හා එකඟතා ලිපි බැවින් ඒවායේ පිටපත් ඔබට ලබා දිය නොහැකිය.
>
> නමුත් ඇමුණුම් අංක 21 ඔබට පිටපත් සහිතව නැගෙනහිර පළාත් ඉඩම් කොමසාරිස් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලද ලිපිය හා ඇමුණුම් අංක 22 ඔබ විසින් ලබා දෙන ලද ලිපි බැවින් එම ලිපිවල පිටපත් මේ සමග අමුණා ඇත ."

ඒ අනුව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටින්නේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු අයිතම 01 සඳහා පොදු අධිකාරිය විසින් 2020/01/31 දිනැතිව තොරතුරු මුදා හැර ඇති බවයි. තොරතුරු අයිතම 02 සඳහා අදාළ වන තොරතුරු තුන් වන පාර්ශවයක් විසින් පරීක්ෂනයක් සඳහා ලබාදී ඇති ප්‍රකාශයන් හා එකඟතා ලිපි බව නිරීක්ෂණය වේ.

**නියෝගය:**

ඒ අනුව තොරතුරු අයිතම 02 සඳහා අදාළ වන තොරතුරු තුන් වන පාර්ශවයක් විසින් පරීක්ෂනයක් සඳහා ලබාදී ඇති ප්‍රකාශයන් හා එකඟතා ලිපි බැවින් එම තොරතුරු අභියාචක වෙත මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් නම්කළ නිලධාරියාගේ තීරණය මෙම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ.

තවද අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් 2019.01.31 දිනැතිව ලබාදී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.